මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ **29** 2023.01.31

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023
### අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම

2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 54(2) වගන්තිය අනුව ඉදිරි ඡන්ද විමසීම්වලදී පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයකට හෝ යම් ශාරීරික අශක්නුතාවකට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කර ගැනීම සඳහා සහායකයකු කැටුව යා හැකි වන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

එහෙත් එම කැටුව යන සහායකයා වයස 18 සම්පූර්ණ වූවකු විය යුතු අතර එම ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන අපේක්ෂකයකු නොවිය යුතු ය. එමෙන්ම එම ඡන්ද විමසීමේ දී දේශපාලන පක්ෂයක බලයලත් නියෝජිතයකු හෝ ඡන්ද පොළ නියෝජිතයකු වශයෙන් කටයුතු නොකරන්නකු ද විය යුතු ය. ඊට අමතරව කිසියම් අශක්නුතාවකට පත් නොවූ අයකු ද විය යුතු ය.

ඉහත සඳහන් පරිදි සහායකයකු කැටුව යාම සඳහා අදාළ පනතේ දසවන උපලේඛනය මගින් හඳුන්වා දී ඇති යෝග්‍යතා සහතිකයක් අදාළ ඡන්ද පොළෙහි නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

මෙම යෝග්‍යතා සහතිකය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉල්ලුම් පත්‍ර ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත පළාත් පාලන බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන් ගෙන් ලබා ගත හැකිය. අදාළ යෝග්‍යතා සහතිකයේ ආකෘතියක් මෙයට යා කොට ඇති අතර එයට අමතරව මැතිවරණ කොමිෂන් සභා වෙබ් අඩවිය (www.elections.gov.lk) වෙත පිවිසීමෙන් ද ලබා ගැනීමට පහසුකම් සලසා ඇත. දෘෂ්‍යාබාධිත හෝ වෙනත් යම් ශාරීරික අශක්නුතාවට පත් පුද්ගලයා ග්‍රාම නිලධාරීගෙන් ඉල්ලුම් පත්‍රයක් ලබාගෙන සම්පූර්ණ කර භාර දී ග්‍රාම නිලධාරීගේ සහතිකය ලබාගැනීමෙන් අනතුරුව එම සහතිකය රජයේ වෛද්‍ය නිලධාරියකු වෙත ඉදිරිපත් කළ යුතු අතර වෛද්‍ය නිලධාරී විසින් ඡන්ද හිමියා පරීක්ෂා කර එම ආකෘතියෙහි ඡන්දදායකයාගේ යෝග්‍යතාව සටහන් කර සහතික කරනු ලැබේ.

අශක්නුතාවට පත් ඡන්දදායකයා විසින් තමාගේ නිල ඡන්ද දැන්වීම්පත, ජාතික හැඳුනුම්පත හෝ ඡන්ද පොළේ දී පිළිගනු ලබන වෙනත් යම් හැඳුනුම්පතක් සහ මෙම යෝග්‍යතා සහතිකය රැගෙන සහායකයා ද කැටුව ඡන්ද පොළ වෙත යා යුතු ය. ඡන්ද පොළ කාර්ය මණ්ඩලය විසින් ඡන්දදායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඡන්ද පොළේ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය අනුගමනය කර ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලබන අතර, එම ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයා සමග ඡන්ද දායකයා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත යොමු කරනු ලැබේ. සහායකයා ද තමාගේ ජාතික හැඳුනුම්පත හෝ ඡන්ද පොළේ දී පිළිගනු ලබන යම් හැඳුනුම්පතක් රැගෙන යාම අත්‍යාවශ්‍ය ය.

ඡන්ද පොළේ දී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් ඡන්ද දායකයාගේ යෝග්‍යතා සහතිකය ලබා ගනු ලබන අතර, කැටුව ආ පුද්ගලයාගෙන් යෝග්‍යතා සහතිකයේ II වන කොටසට පහතින් දැක්වෙන අදාළ ප්‍රකාශය සටහන් කරවා ගනු ලැබේ. අනතුරුව ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ද සමග ඡන්ද හිමියා සහ සහායකයා ඡන්ද කුටිය වෙත කැඳවාගෙන ගොස් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා කාර්ය මණ්ඩල සාමාජිකයා ඉදිරියේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කරවා ඡන්ද පෙට්ටියට බහාලීමට සලස්වනු ලැබේ.

ඉහත සඳහන් යෝග්‍යතා සහතිකයක් නොමැතිව ඡන්ද පොළ වෙත සහායකයකු කැටුව යා නොහැකි බව අවධාරණය කරනු ලැබේ. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව අදාළ යෝග්‍යතා සහතිකය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත රඳවා ගනු ඇත.

08. කෙසේ වුව ද සහායකයකු කැටුව ඒමට නොහැකි වන එවැනි ඡන්ද හිමියකුට අවශ්‍ය වන්නේ නම් මීට පෙර ඡන්ද විමසීම්වල දී සිදු කළ ආකාරයට ම තවත් නිලධාරියෙක් ඉදිරියේ දී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ලවා ස්වකීය ඡන්ද පත්‍රිකාව ලකුණු කරවා ගැනීමට අවකාශ ඇති බව ද මෙයින් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්

(දසවන උපලේඛනය)

**262 වන අධිකාරය වූ (54(2) (ඇ) වගන්තිය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත ප්‍රකාරව යම් අශක්නුතාවට පත් තැනැත්තකුට නිකුත් කරනු ලද ඡන්දය ප්‍රකාශ කිරීමේ යෝග්‍යතා සහතිකය**

**I කොටස**

**අශක්නුතාවට පත් ඡන්ද හිමියාගේ ප්‍රකාශය**

1. සම්පූර්ණ නම : ..........................................................................................................................................
2. ලිපිනය : ..........................................................................................................................................
3. රැකියාවඃ ..........................................................................................................................................
4. උපන්දිනය : ..........................................................................................................................................
5. ජාතික හැඳුනුම්පතේ/රියදුරු බල ප්‍රයේ/විදේශ ගමන් බල පත්‍රයේ අංකය : ......................................................................

ඉහත සඳහන් ලිපිනයෙහි පදිංචි ........................................................................ වන මම ............................................................ බල ප්‍රදේශයෙහි ලියාපදිංචි ඡන්ද දායකයකු බවත්, ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවත් ප්‍රකාශ කරන අතර එළඹෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවට පත් වූ තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට මා හට හිමිකම් ලබා දීමේ සහතිකයක් නිකුත් කරන මෙන් මෙයින් ඉල්ලුම් කරමි.

..................................................................

ඡන්ද හිමියාගේ අත්සන/ වම් අතේ මාපටැගිලි සලකුණ

දිනය : .........................                                        නම : .......................................

ඉහත ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් පහත දැක්වෙන තොරතුරු මවිසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව නිවැරදි බවත් සහතික කරමි.

**ඡන්ද හිමි නාමලේඛනයේ සඳහන් පරිදි තොරතුරු**

1. ඡන්ද හිමියාගේ නම : ..................................................................  2. දිස්ත්‍රික්කය : ..........................................
3. පළාත් පාලන ආයතනය : ..........................................................  4. කොට්ඨාස අංකය හා නම : ..............................
5. ඡන්ද කොට්ඨාසය හා අක්ෂරය : ..............................................  6. ඡන්ද හිමියාගේ අනු අංකය : ............................
7. වෙනත් අදාළ තොරතුරු : ..........................................................................................................................
   ..........................................................................................................................................

......................................

දිනය : ..........................                                        ග්‍රාම නිලධාරීගේ අත්සන

නිල මුද්‍රාව

**II කොටස**

**රජයේ වෛද්‍ය නිලධාරීගේ සහතිකය**

ඉහත නම් සඳහන් අයදුම්කරු මවිසින් පෞද්ගලිකව පරීක්ෂා කළ බවත් නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට, ඒ .............................................................. යන අය සුදුසුකම් * ලබන/නොලබන බවත් මෙයින් සහතික කරමි. (* අනවශ්‍ය වචන කපා හරින්න)

........................................

රජයේ වෛද්‍ය නිලධාරී අත්සන

දිනය : ..............................                                        නම : ........................................

නිල මුද්‍රාව

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා                                        (අයදුම්පත් අනු අංකය : .....................)

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් මෙම කොටස සම්පූර්ණ කරවා ගත යුතුය.

- ඡන්ද හිමියා කැටුව ආ තැනැත්තාගේ නම : ..........................................................................................
- ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |
- පදිංචි ලිපිනය : ..........................................................................................................................

අශක්නුතාවකට ලක්ව ඇති ඉහත I කොටසේ නම සඳහන් ඡන්ද හිමියා වෙනුවෙන් ඡන්දය සලකුණු කිරීමට පැමිණි මම වයස අවුරුදු 18 ඉක්මවූ අයෙකු බවත් මෙම ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු/ බලයලත් නියෝජිතයකු/ ඡන්ද පොළ නියෝජිතයකු හෝ ඡන්ද පොළ කාර්ය මණ්ඩල සාමාජිකයකු නොවන බවත්, යම් අශක්නුතාවකට ලක් වූ අයකු නොවන බවත් ප්‍රකාශ කර සිටිමි.

නම.........................................                                        ................................................

කැටුව ආ තැනැත්තාගේ අත්සන